# පැරණි ශිලාලේඛනවලින් හෙළිවන පංචශීල ප්‍රතිපදාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්


ආර්.එම්.එස්.එච්.රණසිංහ

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

HarshamaliRMS@gmail.com



ප්‍රමුඛ පදඃ පංචශීල ප්‍රතිපදාව, ශිලාලේඛන, පැරණි සමාජය, බෞද්ධාගම


## හැඳින්වීම

පැරණි ශිලා ලේඛනවලින් හෙළිවන පංචශීල ප්‍රතිපදාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම හා එමගින් සමකාලීන හා වර්තමානයේ සමාජ තත්ත්වය පිළිබඳ සංසන්දනාත්මකව විමසා බැලීම මෙම පර්යේෂණය තුළින් සිදු කෙරේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් සෙල්ලිපිවල අන්තර්ගත වන්නා වූ පංචශීල ප්‍රතිපදාව ප්‍රාථමික හා ද්විතියික සාහිත්‍යය මූලාශ්‍රයන් මෙන්ම ක්ෂේත්‍ර ගවේශන යන ක්‍රමවේදයන් මගින් තොරතුරු ඒකරාශී කර ගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ලොව බොහෝ රාජයයන්හි සංස්කෘතික හා ඓතිහාසිකමය වශයෙන් සැබෑ තතු අනාවරණය කර ගැනීමෙහිලා ප්‍රාමාණික වන ප්‍රධානතම මූලාශ්‍රයක් ලෙස ශිලා ලේඛන (Inscriptions ) භාවිත කළහැකි ය. පාෂාණයක් යොදාගෙන සකස් කළ ලේඛණය ශිලා ලේඛනය යි. මීට අමතරව ගලක නොවන තැනක එනම් තඹ තහඩුවක, මැටි බඳුනක ආදී වෙනත් මාධ්‍යයක ලියූ ලේඛනය (Epigraphic ) අභිලේඛනය යි. සාහිත්‍යය මූලාශ්‍රයන් මෙන්ම පුරාවිද්‍යා මූලාශ්‍රයන්ගෙන් අතීතය කියැවීම ප්‍රාමාණිකත්වයෙන් ප්‍රායෝගිකත්වයෙන් හා ඵලදායිත්වයෙන් අනූන වේ. ශිලා ලේඛන සමකාලීනව ලියැවුණු මූලාශ්‍ර හේතුවෙන් විශ්වාසනීයත්වයෙන් යුක්ත වන අතර අනෙකුත් මූලාශ්‍රයවල සඳහන් තොරතුරු සත්‍යය භාවය තහවුරු කර ගැනීමෙහිලා උපකාරී වේ. ලංකාවේ ශිලා ලේඛන කලාව ආරම්භ වූයේ ක්‍රි.පූ. 3 වැනි සියවසේ මහින්දාගමනයත් සමඟ බව බොහෝ උගතුන්ගේ හා විද්වතුන්ගේ පිළිගැනීමයි. මහින්දාගමනයෙන් පසු මෙරටට බ්‍රාහ්මීය අක්ෂර මාලාව ලැබීමෙන් පසු සෙල්ලිපි මාධ්‍යය බොහෝ සෙයින් ජනප්‍රියත්වයට පත් විය. මුල් අවධියේදී මෙම සෙල්ලිපි භික්ෂූන්ට ලෙන් පිදූ කටාරම්වල" අගත අනගත චතුදිශ ශගශ " යනුවෙන් දක්නට ලැබුණු අතර එහි ලෙන් පිදූ පුද්ගලයන්ගේ නම්,ගම්, තනතුරු ආදී ඉතා සුලු තොරතුරු පමණක් සඳහන් වූ අතර වෙස්සගිරිය, මිහින්තලය, ආදී ස්ථානවල ඇති ශිලා ලේඛන මේ සඳහා උදාහරණ වේ. නමුත් පසු කාලයට වන්නට සෙල්ලිපිවල අන්තර්ගතය ඉතා සංකීර්ණ වූ අතර ක්‍රම ක්‍රමයෙන් එහි විවිධ කරුණු කාරණා දක්වන්නට විය. මේවායෙහි අන්තර්ගතය දෙස බැලීමේදී එහි ආගමික කරුණු දේශපාලනික කරුණු සමාජ , සංස්කෘතික ආදී විවිධ තොරතුරු දක්වන්නට විය. විශේෂයෙන්ම මෙය අතීත සමාජය අනාගතය කරා ගෙන යන්නා වූ සුවිශේෂ කැඩපතක් බඳු ය. මහින්දාගමනයත් සමඟ ආරම්භ වූ ශිලා ලේඛන කලාව මූලිකවම භික්ෂු සංඝයා කරණ කොට ගත්තක් වන

අතර කල් යත්ම එය භික්ෂූන්ට මෙන්ම රාජකීයන්ටද ඉතා සමීප විය. මෙම ශිලා ලේඛන අතුරින් බොහෝ දුරට ආගමික අංශය පිළිබිඹු වීමක් දක්නට ලැබේ. ආගමික අංශය අතින් මේවායෙහි භික්ෂූන් විෂයෙහි කරන ලද ආරාම පිදීම්, ඒවාට දෙන ලද ඉඩකඩම්, කුඹුරු ආදී පරිත්‍යාගයන්, විවිධ බෞද්ධාගමික උත්සව බොහෝමයක් සඳහන් වේ. මෙසේ සඳහන් වන්නා වූ ශිලා ලේඛනවල ඍජු වශයෙන් නොවෙතත් වක්‍ර වශයෙන් ථේරවාදී බෞද්ධාගමේ පදනම වන පංචශීල ප්‍රතිපදාවට අයත් තොරතුරු අන්තර්ගත වී තිබේ. මෙම පංචශීල ප්‍රතිපදාවට අදාළ තොරතුරු සඳහන් වන්නා වූ ශිලා ලේඛන අතර වේවැල්කැටියේ ශිලා ලේඛනය, බදුලු ටැම් ලිපිය, කිරිබත්වෙහෙර ටැම් ලිපිය, අනුරාධපුර පස්වැනි කාශ්‍යපගේ පුවරු ලිපිය, පඬුවස්නුවර ආසන ලිපිය ආදී ලිපි පෙන්වාදිය හැකි ය. වේවැල්කැටියේ ශිලා ලේඛණයේ "කිසිවෙකු කොටා මැරුවහොත් , කඩ පළා සොරකම් කලහොත් " ලෙසින් සඳහන් වන්නේ පංචශීල ප්‍රතිපදාවේ සඳහන් වූ මුල් ශික්ෂා පද දෙක වේ. මෙහිදී පෙනී යන්නේ පංචශීල ප්‍රතිපදාවේ ආභාෂය ඒ සඳහා ලැබී ඇති බඳුලු ටැම් ලිපියේ "ගමට පැමිණි රාජකීය නිළධරින් , රා-මස්-කිරි-තෙල් නොගැනීම ද , "රජයේ බදු මණින ලහස්සෙන් මනිනු විනා සෙසු ලහස්වලින් නොමැනීම ද" ලෙසින් සඳහන් වන්නේ සිව්වැනි සහ පස්වන ශික්ෂා පද වේ. පඩුවස්නුවර ආසන ලිපියේ"ගැනියකුදූ අනගි රුවනකදූ ගෙනයන කල කුමක් දැයි නොවිරාන නියායෙන් නිෂ්කාෂ්ඨක කොට " යනුවෙන් සදහන් වන්නේ තෙවැනි ශික්ෂා පදය වේ. කිරිබත්වෙහෙර ශිලා ලේඛණයේ "අයුතු වරදක් කොට වත්තට ඇතුලු වුවහොත් බෙහෙත් ගෙයි පාලකයන්ට කියා පිටත සිට ඉවත් කරවා අල්ලා ගනු මිස " ලෙසත් අනුරාධපුර පස්වැනි කසුප්ගේ පුවරු ලිපියේ පංච මහා සාවද්‍යය වරද නොසොයනු මැනවි" යනුවෙන් සඳහන් වන්නට ඇත්තේ පංචශීල ප්‍රතිපදාව බැව් පැහැදිලි වේ.

මෙලෙස ශිලා ලේඛනවලට පංචශීල ප්‍රතිපදාව ඇතුලත් වීම තුළින් එකල සමාජයේ තිබූ පරිහානිය මෙන්ම ඒ සඳහා විවිධ දඬුවම් තුළින් ඒවා සමනය කරගත් ආකාරය අධ්‍යයනය කළ හැකි ය. ඔවුන් මේ පිළිබඳව මහජනයා ඍජුව ම දැනුවත් කර තිබීම සිදු කර තිබේ. මෙම ශිලා ලේඛන බොහොමයක් මහජනයා ගැවසෙන ප්‍රසිද්ධ ස්ථානවල ස්ථාපිත තරන්නට වග බලාගෙන ඇත්තේ එමඟින් සමාජයේ සිදුවන දූෂණ, වංචා, හොර මැරකම්, මිනීමැරුම් ආදිය මගහරවා ගැනීමටය. එකල ප්‍රභූවරු, රජවරු ආදීන් ආරාම, පන්සල්, උද්‍යාන, කෙත්වතු, පැවදි උතුමන් වෙනුවෙන් සකස් කර පූජා කිරීමේදී කවුරු විසින් කාහට කුමන අරමුණක් වෙනුවෙන් පූජා කරන්නේදැයි දැක්වීමට ප්‍රමුඛත්වයක් දුන් අතර එමඟින් තම රාජ අණ පණත් මහජනයා අතරට ගෙන යාමට එම ශිලා ලේඛන උපයෝගී කරගත් බව පැහැදිලි වේ. එමඟින් පංචශීල ප්‍රතිපදාව කඩ කරන්නන් හට ලබා දෙනු ලබන දඬුවම් සඳහන් කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී තිබේ. ඒ සඳහා වේවැල්කැටිය ශිලා ලේඛනය ප්‍රබල වූ සාක්ෂියක් ගෙන එයි. අධිකරණ කටයුතු මෙහෙයවීම සඳහා විශේෂයෙන් පිරිසක් සිටි බව ඉන් පෙනේ. මෙහි සඳහන් වන්නේ "දසගම ඇත්තන් හිද විචාරා උපන් දැයටි පෑ හැකි සේ ලියා තබා මැරුවහු මරා" (10-12 පේළි) යනුවෙන් දසගම ඇත්තනට මිනී මැරීම්,සොරකම් කිරීම් ආදියට මරණීය දණ්ඩනය දීමට පවා බලය තිබිණි. " සම්දරුවන් දණ්ඩනායකයින් හින්ද විචාරා කොට් හැරිය යුතුවක් හර්නා ඉසා, මිනී කොටා සඟුන් වන් කෙනෙකුන් ඇත. එහි පහළ වනුද් ඔවුන්ජ් විචාරා කොට් දඹදිව් යවන්නට හර්ණා ඉසා" ආදී වශයෙන් පස්වන කසුබ්ගේ පුවරු ලිපියේ (23-26 පේළි) රටින් නෙරපීමට පවා බලය පවරා ඇත. පෙර සිරිත නමින් නීති සංග්‍රහයක්

තිබුණ බව බදුලු ටැම්ලිපියේ සඳහන් වේ. මේ ආකාරයට බෞද්ධාගමික මුහුණුවරකින් දඬුවම් ක්‍රම මඟින් එකල සමාජය පාලනය වූ බව පෙනේ. කෙසේ වෙතත් මෙහිදී සැලකිය යුතු කාරණාව වන්නේ දඬුවම් ලබාදීම යන කාර්යය ප්‍රසිද්ධියේ ලබා දුන් බව යි. එමඟින් යම් තරමකින් හෝ සමාජය හික්මවීමට හෙවත් ශික්ෂණයකට පාත්‍ර වන්නට ඇත. වර්තමානය හා සැසඳීමේදී පංචශීල ප්‍රතිපදාව කඩ කිරීම තුළින් පෙර සමාජයේ පැවති දඬුවම් ක්‍රම ලබාදීමක් දක්නට ලැබුනද එය පැරැන්නේ තරම් සංකීර්ණ නොවේ. මිනී මැරීම්, මංකොල්ලකෑම්, ආදියට මරණ දඬුවම ලබා දුන්න ද අනෙකුත් වරදවල්වලදී, එනම් කාමේහි වරදවා හැසිරීම, බොරු කීම, රහමෙර පානය ආදියට දඬුවම් ක්‍රම දැඩි භාවයක් දක්නට නැති තරම් වේ. පූර්ව සමාජයෙහි මෙම වැරදි සඳහා දැඩි දඬුවම් පැමිණ වූ අතර එකල සමාජයේ පිරිහීමද අඩු වු බව පෙනේ. නමුත් වර්තමානය වන විට නීතියේ රැහැනින් මිදී පලා යාමට තරම් නීතිය මුලා වී ඇත. එය හේතුව වී ඇත්තේ නීතියේ දැඩි භාවයක් නොමැති වීමයි. නීතිය ක්‍රියාත්මක කරන්නන්ගේ ඇති දුර්වලතාවය යි. මේ සියලු කරුණු අධ්‍යයනයේ දී පෙනී යන කාරණාව වන්නේ මෙම ශිලා ලේඛන තුළින් පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා කිරීමට හා අනුගමනය කිරීම සඳහා නිරන්තරයෙන් යොමු කළ බවත් පැරණි ශිලා ලේඛන තුළින් ඍජුවම නොවෙතත් වක්‍රව හෝ පංචශීල ප්‍රතිපදාව දක්නට ලැබෙන බවයි. බෞද්ධ ආගමේ පංචශීල ප්‍රතිපදාවට එකඟ වූ යුක්ති සහගත සමාජයක් ගොඩනැගීමට ගත් උත්හසයක් මෙමඟින් පිළිබිඹු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අමරවංශ හිමි, කොත්මලේ. (2014)*ලක්දිව සෙල්ලිපි*. කොළඹ: ඇස් ගොඩගේ සහ සමාගම.

විජේතුංග, සිරිසමන්. (2007)*ශ්‍රී ලංකාවේ ශිලාලිපි සන්නිවේදනය*. ඉංගිරිය: ආරිය ප්‍රකාශකයෝ.